සැ. යු.- 2013.07.05 දින පළ වූ අංක 1818 දරන ගැසට් පත්‍රයේ I : III සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,819 - 2013 ජූලි 12 වැනි සිකුරාදා - 2013.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 1192 |

*සැ. යු.* - (i) ශ්‍රී සිද්ධාර්ථ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැගීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අගෝස්තු මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූලි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විවිධ දැන්වීම්

## ශ්‍රී ලංකා ලුම්බිණි සංවර්ධන භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

වී. කේ. ඉන්දික වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "ශ්‍රී ලංකා ලුම්බිණි සංවර්ධන භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ශ්‍රී ලංකා ලුම්බිණි සංවර්ධන භාරය සංස්ථාගත කිරීමයි :-

*(අ)* සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය සිදුවූ නේපාලයේ ලුම්බිණි නුවර සාලවනෝද්‍යානය පාදකකොටගෙන කපිලවස්තු, දෙව්දහ, රාමග්‍රාම්, ආශ්‍රිතව පුරාණයේ සිට පවතින ථෙරවාදී බෞද්ධ ධර්මායතනයක් පිහිටුවා නේපාලය සහ තදාසන්න රටවල ථෙරවාදී බෞද්ධ සංස්කෘතිය දියුණු කිරීම මෙන්ම භික්ෂූන්වහන්සේ පුහුණු කිරීම, භික්ෂූන් වහන්සේ ධර්මප්‍රචාරය සඳහා යොමු කිරීම,

*(ආ)* ශ්‍රී ලංකා රජය මගින් පිහිටුවා ඇති ලුම්බිණි නුවර ශ්‍රී ලංකාරාමය දියුණු කිරීම, සංරක්ෂණය කිරීම, මගින් නේපාලය තුළ ථෙරවාදී බෞද්ධ ප්‍රබෝධය ඇති කිරීම,

*(ඇ)* ශ්‍රී ලංකා රජය මගින් ලුම්බිණි නුවර පිහිටුවා ඇති "ශ්‍රී ලංකා විශ්‍රාම ශාලාව" මනා කළමනාකරණයකින් පවත්වාගෙන යාම, ඒ ආශ්‍රිතව ආදායම් උපදවා ශ්‍රී ලංකාරාමය ඇතුළු ථෙරවාදී බෞද්ධ ධර්මායතනය පවත්වාගෙන යාම, ථෙරවාදී විහාරාරාම දියුණු කිරීම,

යනාදිය වේ.

වී. කේ. ඉන්දික,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

07-215

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.